# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2036/6 – 2017 සැප්තැම්බර් 11 වැනි සඳුදා – 2017.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම් පත්තු සහ කඩවත් සුළු කොට්ඨාසයේ, පුත්තලම නගර සභා සීමාව තුළ සේනකුඩිරුප්පුව පුත්තලම කොට්ඨාස අංක 03 තම්මැන්නා අඩවිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක පීයූ/පීටීටී/2015/437 හා 2016.02.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.2197 ක් පමණ වන මුඩලිය සෙනායි වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මුඩලිය සෙනායි වත්ත – ප්‍රමාණය: හෙක්. 1.2197ක් පමණ**

උතුරට: සෙයිනුල් අබදීන් සහ තවත් අය හිමිකම් කියන අශෝක ඩේවිඩ් වත්ත පොලවත්ත සහ එම්. එන්. එම්. අබුදුල් හසීබ් හිමිකම් කියන මුඩලිය සෙනායි වත්ත පොල් වත්ත; නැගෙනහිරට: එම්. එන්. එම්. අබුදුල් හසීබ් හිමිකම් කියන මුඩලිය සෙනායි වත්ත පොල් වත්ත; දකුණට: එම්. එන්. එම්. අබුදුල් හසීබ් හිමිකම් කියන මුඩලිය සෙනායි වත්ත පොල් වත්ත, අනුරාධපුර පාර සහ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හිමිකම් කියන මුඩලිය සෙනායි වත්ත ගෙවත්ත; බටහිරට: සෙයිනුල් අබදීන් සහ තවත් අය හිමිකම් කියන අශෝක ඩේවිඩ් වත්ත පොලවත්ත.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/9/2015/ඩබ්ලිව්එස්/210.
2017 අප්‍රේල් මස 07 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 664

1A – G26244 – 37 (2017/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹන්ගඟකෝරළේ සුළු කොට්ඨාසයේ, පල්ලේතැන්න ගමේ පිහිටි, මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/ඒඑම්බී/2016/159 හා 2016.10.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.3744 ක් පමණ වන සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඕපල්ගලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.3744ක් පමණ**

උතුරට: අඹන්ගඟකෝරළේ අධ්‍යාපන කාර්යාලය පිහිටි පල්ලේතැන්න වත්ත, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; නැගෙනහිරට: මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ එස්. සිවකුමාර් සහ තවත් අය හිමිකම් කියන පල්ලේතැන්න වත්ත; බටහිරට: එස්. සිවකුමාර් සහ තවත් අය හිමිකම් කියන පල්ලේතැන්න වත්ත සහ අඹන්ගඟකෝරළේ අධ්‍යාපන කාර්යාලය පිහිටි පල්ලේතැන්න වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය : 4-3/2/2015/එච්ඒ/299.
2017 ජූලි මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 665

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

2017 ජූලි 19 වැනි දින අංක 2028/20 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ සඳහන් ප්‍රමාණය ''හෙක් 0.0165'' යන්න ''හෙක් 0.615'' ලෙස සංශෝධනය විය යුතුය.

ඩී. එම්. ඩබ්ලිව්. ටී. යූ. දිසානායක,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
මහනුවර.

2017 අගෝස්තු මස 30 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ
ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

09- 666

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.